# මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

# කාර්ය සාධන වාර්තාව 2018

**තැ.පෙ. අංක 533 - 341, ඇල්විටිගල මාවත, කොළඹ 05**

**පටුන** **පිටු අංකය**

1. දෙපාර්තමේන්තු පසුබිම

1.1 ගමන් මඟ ........................................................................................ 1

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම..............................................................................1

1.3 දෙපාර්තමේන්තුවේ මෙහෙවර ..........................................................................1

1.4 දෙපාර්තමේන්තුවේ වටිනාකම් .........................................................................1

1.5 සංවිධාන ව්‍යුහය ...............................................................................................2

1.6 දෙපාර්තමේන්තුවේ අරමුණු ...............................................................................3

1.7 දෙපාර්තමේන්තුවේ කාර්යභාරය .........................................................................3

1.8 කාර්යාලීය ව්‍යාප්තිය ...........................................................................................4

2. කාර්ය මණ්ඩලය

2.1 මාණ්ඩලික නිලධාරී කාර්ය මණ්ඩලය - 2018 ............................................5

2.2 කාර්ය මණ්ඩල තොරතුරු හා අනුමත සේවක සංඛ්‍යාව - 2018 ......................6

3. සේවක අභිප්‍රේරණය

3.1 අභිප්‍රේරණයේ වැදගත්කම ................................................................................7

3.2 බාහිර පුහුණු ........................................................................................................7

3.3 කාර්ය මණ්ඩලයේ කුසලතා සංවර්ධනය සඳහා පැවැත්වූ වැඩසටහන් ............8

3.4 නිල මෙහෙවර ජනපති ජනතා සේවය යටතේ දෙපාර්තමේන්තුවේ දායකත්ව...8

4. පරිපාලනය

4.1 දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු ..............................................................9

4.2 ප්‍රධාන කාර්යාලයේ අංශ ...............................................................................9-10

4.3 ප්‍රධාන කාර්යාලයේ අංශයන්ගේ කාර්යභාරය ...........................................10-14

I. කොමසාරිස් ජනරාල් කාර්යාලය .....................................................10

II. ආයතන ශාඛාව ...........................................................................10

III. සංවර්ධන ශාඛාව .........................................................................10

IV. ගිණුම් ශාඛාව ..............................................................................11

V. පරිගණක හා තොරතුරු තාක්ෂණ ශාඛාව .........................................11

VI. අභ්‍යන්තර විගණන හා විමර්ශන ශාඛාව ........................................11

VII. නීති ශාඛාව ...................................................................................11

VIII. සුඛෝපභෝගී බදු ශාඛාව ..............................................................12
IX. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව I හා II ....................................12
X. ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව .................................................12
XI. යතුරු පැදි නව ලියාපදිංචි ශාඛාව ..................................................12
XII. වාහන අයිතිය පැවරීමේ ශාඛා .......................................................13
XIII. කාර්මික ශාඛාව ..........................................................................14
4.4 වේරහැර උප කාර්යාලය ..........................................................................14
4.5 දිස්ත්‍රික් කාර්යාල ...................................................................................14

5. දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය
5.1 දෙපාර්තමේන්තුවේ ප්‍රදාන මහජන සේවාවන් වල සංඛ්‍යාත්මක ප්‍රගතිය .........15-29
5.1.1 ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය ..........................15-22
5.1.2 වාහන හිමිකම් පැවරීම ලියාපදිංචි කිරීම ..........................................22-23
5.1.3 රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව ............................................23-25
5.1.4 කාර්මික සේවාව ..............................................................................25-26
5.1.5 වායු විමෝචන පරීක්ෂණ කාර්යයන් නියාමනය කිරීම .....................26-28
5.1.6 මාර්ග ආරක්ෂාව පිළිබඳ කාර්යයන් ................................................28-29

5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ..........29-30
5.2.1 රියදුරු අභිවෘද්ධි ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරීම .............................29
5.2.2 ඊ - මෝටරින් ව්‍යාපෘතිය ................................................................30

5.3 අයවැය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය ...31
5.4 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දැනට ක්‍රියාත්මක කාර්යන්හි
වර්තමාන ප්‍රගතිය ......................................................................... .......32

6. ආදායම හා වියදම
6.1 ආදායම් ගිණුම ........................................................................................33

6.2වියදම් ගිණුම ..........................................................................................34

## මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ගේ පණිවුඩය

1928 වර්ෂයේදී ආරම්භ කරන ලද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 89 වන කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීමට හැකි වීම පිළිබඳව සතුටු වෙමි. මෝටර් රථ වාහන නව ලියාපදිංචි කිරීම, හිමිකම් පැවරීම ලියාපදිංචිය, රියදුරු බලපත්‍ර නිකුත් කිරීම, මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාව , මාර්ග ආරක්ෂාව හා වායු විමෝචන තත්ත්ව නියාමනය කිරීම යනාදිය මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් වේ.

2018 වර්ෂයේ ප්‍රගතිය සලකා බැලීමේදී, නව ලියාපදිංචි මෝටර් වාහන සංඛ්‍යාව 480,799 ක් විය. මෙම වසරේ දී සිදු කරන ලද වාහන පැවරුම් සංඛ්‍යාව 668,295 ක් වන අතර නිකුත් කරන ලද රියදුරු බලපත් ප්‍රමාණය 806,600 ක් වේ. ඒ අනුව වසර අවසානය වන විට ශ්‍රී ලංකාවේ සම්පූර්ණ මෝටර් රථ ගහණය 7,727,921 ක් වේ.

මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව ඉටු කිරීමේ දී, මෝටර් රථ නියාමනයෙහි සිදු කරන ලද අවශ්‍ය මඟ පෙන්වීම් වෙනුවෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා ගරු අමාත්‍යතුමන්ට හා නියෝජ්‍ය අමාත්‍යතුමන්ටත්, ඒ සඳහා යටිතල පහසුකම් හා උපදෙස් ලබා දෙමින් සහයෝගය ලබා දුන් අමාත්‍යාංශ ලේකම්තුමන්ටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. එසේම දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටුකිරීමෙහිලා අවශ්‍ය සහයෝගය ලබා දුන් දෙපාර්තමේන්තුවට සම්බන්ධ සියලු ආයතන වලටත්, දෙපාර්තමේන්තු අරමුණු ඉටුකර ගැනීමෙහි ලා කැපවීමෙන් යුතුව කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දුන් දෙපාර්තමේන්තුවේ සියලු කාර්ය මණ්ඩලයටත් ස්තූතිය පුද කරමි. මෝටර් වාහන නියාමනය සඳහා නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් වඩාත් ශක්තිමත්, කාර්යක්ෂම හා නිවැරදි සේවාවක් සැපයීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම එළඹෙන වසරේ අපගේ බලාපොරොත්තුවයි.

**ඒ.එච්.කේ.ජගත් චන්ද්‍රසිරි**
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්

# 1. දෙපාර්තමේන්තු පසුබිම

## 1.1 ගමන් මග

ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද නව මෝටර් වාහන ලියාපදිංචි කිරීම වස් වර්ෂ 1928 ජනවාරි මස 01 වන දින මෝටර් වාහන රෙජිස්ට්‍රාර් කාර්යාලය ආරම්භ කරන ලද අතර, එය වර්ෂ 1951 අංක 14 දරණ මෝටර් වාහන පනත මගින් දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කරන ලදී. 1951අංක 14 දරණ මෝටර් වාහන පනත මඟින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ලෙස පරිවර්තනය කරන ලදී . ශ්‍රී ලංකාව තුළ මෝටර් වාහන ලියාපදිංචිය,නියාමනය,රියදුරු බලපත් නිකුත් කිරීම,මාර්ග ආරක්ෂාව හා පරිසර හිතකාමී වාහන භාවිතය යන අරමුණු පෙරදැරිව කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සපයනු ලබයි.

වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ වාහන භාවිතයේ සීඝ්‍ර වැඩිවීමත් සමගම පුළුල් වී ඇති දෙපාර්තමේන්තු කාර්යන් ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉටු කිරීම සඳහා නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින්,වේරහැර රියදුරු බලපත් අංශය හා බොහොමයක් දිස්ත්‍රික් කාර්යාල මාර්ගගත (online) සම්බන්ධතාව මත ක්‍රියාත්මක වේ.

සියලුම දිස්ත්‍රික් කාර්යාල මාර්ගගත (online) සම්බන්ධතාව මගින් නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලය සමඟ සම්බන්ධ වීමෙන් ,ග්‍රාමීය/ප්‍රාදේශීය මට්ටමේ සේවාලාභීන්ගේ අපේක්ෂාවන් / අවශ්‍යතා කඩිනමින් ඉටුකිරීමත්, නවීන පහසුකම් සහ නව තාක්ෂණය තුළින් සේවාලාභී අපේක්ෂාවන් වඩා පහසු කරලීමත් දෙපාර්තමේන්තුවේ ඉදිරි අභිලාෂයන් වේ.


## 1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම

**“ විශිෂ්ඨ මෝටර් වාහන නියාමනයෙන් ඉහළ මහජන ප්‍රසාදය”**


## 1.3 දෙපාර්තමේන්තුවේ මෙහෙවර

**“අභිප්‍රේරණය වූ සේවක සමූහයේ සාමූහික ප්‍රයත්නය හා නවීන තාක්‍ෂණය යොදා ගනිමින් මෝටර් වාහන පනත හා අනෙකුත් නීති රෙගුලාසි ප්‍රශස්ත ලෙස ක්‍රියාත්මක කිරීමෙන් ඉහළ මහජන ප්‍රසාදයක් උදෙසා කැපවීම.”**

## 1.4 දෙපාර්තමේන්තුවේ වටිනාකම්



## 1.5 සංවිධාන ව්‍යුහය


DEPARTMENT OF MOTOR TRAFFIC
ORGANIZATIONAL STRUCTURE
COMMISSIONER GENERAL OF MOTOR TRAFFIC
GA/DS
DISINATION ABBER
C.F.O –CHIEF FINANCIAL OFFICER
D.C - DEPUTY COMMISSIONER
D.D.C/A.C- DISRICK DEPUTY/ASSISTANT COMMISSIONER
A.C- ASSITANT COMMISSONER
P.D(E)- PROJECT DIRECTOR
CA- CHIEF ACCOUNTANT
C/IA -CHIEF INTERNAL AUDITOR
ACC - ACCOUNTANT
GA/DS - GOVERNMENT AGENT/DISTRICT SECRETARY
A.O(A.D) - ADMINISTRATIVE OFFICER (ADMIN)
A.O(D.E) - ADMINISTRATIVE OFFICER (DEVELOPMENT)
L.O-LEGAL OFFICER
S.T.O- STATISTICAL OFFICER
S.K- STORE KEEPER
S.O- SUPERVISING OFFICER
S.E.M.V- SENIOR EXAMINER OF MOTOR VEHICLE
E.M.V - EXAMINER OF MOTOR VEHICLE
A.D(IT) - ASSISTANT DIRECTOR(IT)
P.R.G.M- PROGRAMMER
STA -STAFF


## 1.6 දෙපාර්තමේන්තුවේ අරමුණු

1. ලංකාවේ නිෂ්පාදිත සහ මෙරටට ආනයනය කරන ලද සියලුම වාහන ලියාපදිංචිය තහවුරු කිරීම. (New Registration)
2. ධාවනය කළ හැකි සියලුම වාහන වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීම. (Transfer)
3. කාර්යක්ෂම කාර්මික සේවාවක් සැලසීම.
4. මාර්ග නීති පිළිපදින විනයගරුක රියදුරන් බිහිකිරීම තුළින් මාර්ග ආරක්ෂාව සහතික කිරීම.
5. ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් රියදුරු බලපත්‍රයක් ලබා ගැනීම.
6. පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් නිර්මාණය කිරීම.

## 1.7 දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

1. ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය.
2. වාහන හිමිකම් පැවරීම ලියාපදිංචිය.
3. රියදුරු බලපත්‍ර නිකුත් කිරීම.
4. මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාව.
5. වායු විමෝචන තත්ත්වය නියාමනය.
6. මාර්ග ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය.

## 1.8 කාර්යාලීය ව්‍යාප්තිය



# 2 කාර්ය මණ්ඩලය

## 2.1 මාණ්ඩලික නිලධාරී කාර්ය මණ්ඩලය - 2018

| | |
|---|---|
| • මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් | - ඒ.එච්.කේ.ජගත් චන්ද්‍රසිරි මයා |
| • ප්‍රධාන මූල්‍ය නිලධාරී | - එස්. එල්. හෙට්ටිආරච්චි මයා |
| • කොමසාරිස් (පාලන) | - සුජීවා එස්. ගුරුගේ මිය |
| • කොමසාරිස් ( සංවර්ධන ) | - එම්.සමන්ති මිහිඳුකුල මිය |
| • කොමසාරිස් (විමර්ශන) | - කේ.ඒ.ඩබ්.එල්.ඩබ්.ගුණරත්න මයා |
| • කොමසාරිස් (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | - ඩී.ටී.එෆ් සුරවීර මයා |
| • කොමසාරිස් (රියදුරු බලපත්) | - ජේ.එම්.යූ.කේ.ජයසේකර මයා |
| • ප්‍රධාන ගණකාධිකාරී | - ටී.එච්.තාජුඩීන් මයා |
| • ප්‍රධාන අභ්‍යන්තර විගණක | - ටී.ඕ.ආර් වනිගරත්න මයා |
| • නියෝජ්‍ය කොමසාරිස් (කාර් පැවරුම්) | - ආර්.ජී.කේ. විජේසිංහ මිය |
| • නියෝජ්‍ය කොමසාරිස් (යතුරුපැදි නව) | - කේ.ඒ.ඒ.ඉන්ද්‍රරත්න මයා |
| • නියෝජ්‍ය කොමසාරිස් (යාපනය) | - වයි.පරම්තාමන් මයා |
| • නියෝජ්‍ය කොමසාරිස් (වෙළඳ වාහන න.ලි.ප II) | - ඩබ්.ටී.නයෝමි ප්‍රනාන්දු මිය |
| • නියෝජ්‍ය කොමසාරිස් (කුරුණෑගල) | - ඩබ්.ඒ.ආර් වික්‍රමසිංහ මයා |
| • නියෝජ්‍ය කොමසාරිස් (වේරහැර) | - බී.ඒ.ඩී.ඩී.ඩබ්.සිරිවර්ධන මිය |
| • නියෝජ්‍ය කොමසාරිස් (වෙළඳ වාහන න.ලි.ප I) | - ටී.එම්.ජී.තෙන්නකෝන් මයා |
| • නියෝජ්‍ය කොමසාරිස් (යතුරු පැදි පැවරුම්) | - චෛතිය වීරසූරිය මයා |
| • නියෝජ්‍ය කොමසාරිස් (බස්,ඉඩම්වාහන පැවරුම්) | - ඩී.ඩී.සී. අතුකෝරල මයා |
| • නියෝජ්‍ය කොමසාරිස් | - එච්.එම්.ජේ.එම්.හේරත් මයා |
| • ගණකාධිකාරී (ආදායම්) | - ඒ.එම්.අයි.ඩී.අධිකාරි මිය |
| • ගණකාධිකාරී (ගෙවීම්) | - ඩී. එල්. ඩී. පී. ඒ. ලියනගේ මයා |
| • සහකාර කොමසාරිස් (ලොරි පැවරුම්) | - ඩබ්.කේ.එන්.එන්.එස්.බණ්ඩාර මයා |
| • සහකාර කොමසාරිස් (වෙළඳ වාහන පැවරුම් ) | - එස්.පී.සිරිමාන්න මිය |
| • සහකාර කොමසාරිස් (අනුරාධපුර) | - ඊ.ජී.වික්‍රමසිංහ මයා |
| • සහකාර කොමසාරිස්(ගම්පහ) | - එම්.පී.කසුන් ප්‍රමෝදිත් මයා |
| • සහකාර කොමසාරිස් (හම්බන්තොට) | - එච්.ඩී.සතරසිංහ මයා |
| • සහකාර කොමසාරිස් (තො.සං.තාක්ෂණ) | - එම්.එච්.පී.එල්.ඒ.විජයපාල මයා |
| • සහකාර කොමසාරිස් (කාර්මික) | - ජේ.ඒ.එස්.ජයවීර මයා |
| • සහකාර අධ්‍යක්ෂ(තො.සං.තාක්ෂණ) | - පී. ඩබ්. පී. බී. ඊරියගම මයා |
| • නීති නිලධාරී | - කේ.අයි.යෝගචන්ද්‍ර මයා |
| • පරිපාලන නිලධාරී (පාලන) | - ඒ.එම්.සී.ජේ. අධිකාරි මිය |
| • පරිපාලන නිලධාරී (වේරහැර) | - යූ.අයි.මුණසිංහ මිය |
| • පරිපාලන නිලධාරී (වේරහැර) | - කේ. ඉන්ද්‍රාදේවි මිය |
| • ව්‍යාපෘති අධ්‍යක්ෂක (වායු විමෝචන) | - ආර්.එල්.මොලගොඩ මයා |

## 2.2 කාර්යමණ්ඩල තොරතුරු හා අනුමත සේවක සංඛ්‍යාව - 2018

| තනතුරු නාමය | අයත් සේවය | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | අනුම | සිටින | පුරප්පාඩු |
| කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලංකා පරිපාලන සේවය (විශේෂ ශ්‍රේණිය) | 01 | 01 | 00 |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 01 | 01 | 00 |
| කොමසාරිස් ( පාලන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| කොමසාරිස් (වේරහැර) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| කොමසාරිස් (සංවර්ධන ) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| කොමසාරිස් (තොරතුරු තාක්ෂණ) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| කොමසාරිස් (විමර්ශන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | 01 | 00 |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 01 | 01 | 00 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 01 | 01 | 00 |
| ගණකාධිකාරී (සැපයුම්) | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 01 | 01 | 00 |
| ගණකාධිකාරී (සුබෝපබෝගී බදු) | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 01 | 01 | 00 |
| නියෝජ්‍ය /සහකාර කොමසාරිස් | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 15 | 15 | 00 |
| සහකාර අධ්‍යක්ෂක (තොර: තාක්‍ෂණ) | ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවය | 01 | 01 | 00 |
| සහකාර කොමසාරිස් (කාර්මික) | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 01 | 01 | 00 |
| නීති නිලධාරී | විධායක නිලධාරී සේවය | 01 | 01 | 00 |
| පරිපාලන නිලධාරී | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (අධි පන්තිය) | 03 | 03 | 00 |
| ප්‍රධාන මෝටර් වාහන පරීක්‍ෂක(දෙපාර්තමේන්තු) | ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවය | 16 | 02 | 14 |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තන සේවය | 02 | 00 | 02 |
| පරිගණක වැඩසටහන් සම්පාදක (දෙපාර්තමේන්තු) | දෙපාර්තමේන්තු සේවය | 02 | 01 | * |
| නීති සහකාර | ආශ්‍රිත නිලධාරී සේවය | 03 | 00 | 03 |
| විමර්ශන හා සංවර්ධන සහකාර | ආශ්‍රිත නිලධාරී සේවය | 123 | 121 | - |
| සංවර්ධන සහකාර /සංවර්ධන නිලධාරී | ආශ්‍රිත නිලධාරී සේවය | 200 | 169 | 31 |
| කාර්මික සහකාර (දෙපාර්තමේන්තු) | ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවය | 01 | 00 | 01 |
| මෝටර් වාහන පරීක්‍ෂක | ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවය | 114 | 102 | 12 |
| වැඩසටහන් දත්ත පාලක (දෙපාර්තමේන්ත) | දෙපාර්තමේන්තු සේවය | 01 | 00 | * |
| කළමනාකරණ සහකාර | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 259 | 254 | 05 |
| පරිගණක පද්ධති ක්‍රියාකරු (දෙපාර්තමේන්තු) | දෙපාර්තමේන්තු සේවය | 02 | 02 | * |
| පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු/ තොරතුරු හා සන්.තා. සහකාර | දෙපාර්තමේන්තු සේවය / ඒකාබද්ධ සේවය | 09 | 09 | 00 |
| පිළිගැනීමේ නිලධාරී | දෙපාර්තමේන්තු සේවය | 01 | 01 | 00 |
| දෙපාර්තමේන්තු ලිපිකරු | දෙපාර්තමේන්තු සේවය | 83 | 73 | * |
| රියදුරු (දෙපාර්තමේන්තු/ඒකාබද්ධ) | රියදුරු සේවය | 11 | 12 | 00 |
| කාර්යාල කාර්ය සහායක | කාර්යාල සේවක සේවය (ඒකාබද්ධ) | 87 | 87 | |
| දෙපාර්තමේන්තු කම්කරු | දෙපාර්තමේන්තු සේවය | 28 | 18 | * |
| සනීපාරක්ෂක කම්කරු | දෙපාර්තමේන්තු සේවය | 02 | 01 | |
| **මුළු එකතුව** | | **976** | **884** | **68** |

***මෙම තනතුරු ඔවුන්ට පෞද්ගලික වන සේ බඳවා ගෙන ඇති අතර එම නිලධාරීන් විශ්‍රාම යාමෙන් පසු තනතුරු අහෝසි වේ**

# 3. සේවක අභිප්‍රේරණය

## 3.1 අභිප්‍රේරණයේ වැදගත්කම

දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය ඉහළ නංවා ගැනීම සඳහා කාර්ය මණ්ඩල අභිප්‍රේරණය ඉතා වැදගත් වන බැවින්, ඒ මත පදනම්ව 2018 වර්ෂය පුරාවට හඳුනාගත් වැඩමුළු ක්‍රියාත්මක කිරීම මගින් කාර්ය මණ්ඩල අභිප්‍රේරණය සිදු කරන ලදී .

## 3.2 බාහිර පුහුණු

| දිනය | වැඩමුළුව | පැවැත් වූ ආයතනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 2018.04.08-2018.04.11 | BIMSTEC FRAME WORK INDIA | ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය | 01 |
| 2018.04.22-2018.04.29 | International programme on Management Auditing for the Public Sector Internal Auditing in Malayasia | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 02 |
| 2018.06.09 | ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන්ගේ වෘත්තිය සංවර්ධනය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 50 |
| 2018.07.23,24 | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිපාටික රීති පිළිබඳ දැනුම | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 04 |
| 2018.08.18 | ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහයකයින් සඳහා වෘත්තිය සංවර්ධනය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 40 |
| 2018.09.08 | How to Keep your staff Happy | Colombo School of Business Management ආයතනය | 33 |
| 2018.11.09 – 2018.12.28 | දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 06 |

### 3.3 කාර්ය මණ්ඩලයේ කුසලතා සංවර්ධනය සඳහා පැවැත්වූ වැඩසටහන්

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ විශේෂ කුසලතා සංවර්ධනය උදෙසා පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

2018.06.12,14 හා 19,21 යන දිනවල සංවර්ධන සහකාර නිලධාරීන් හා දෙපාර්තමේන්තු ලිපිකරුවන් 100 දෙනකු වෙනුවෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා උපකාරක වැඩමුළු පවත්වා ඇත.

රියදුරු උපදේශකයින් 350 දෙනකු ලියාපදිංචි කිරීම සඳහා වේරහැර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු කාර්යාල පරිශ්‍රයේ පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.

තවද ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේදී රාජකාරී කටයුතු ඉටු කිරීමේදී නීතිමය පරිසරය තාක්ෂණික දැනුම හා ආකල්ප වර්ධනය,විගණන පනත හා අල්ලස් දූෂණ පනතේ විධිවිධානයන් පිළිබඳ වැඩමුළුවක් නිලධාරීන් 200 දෙනකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

### 3.4 නිල මෙහෙවර ජනපති ජනතා සේවය යටතේ දෙපාර්තමේන්තුවේ දායකත්වය

- නිල මෙහෙවර ජනපති ජනතා සේවය යටතේ සංදිලිප්පායි, උඩුවිල්, කරවෙට්ටි, මරුතංකේනි, කෝපායි, තෙල්ලිප්පලයි, යාපනය, වේලනෛයි, චාවකච්චේරි වංකානෛයි කෛයිට්ස්, කරෙයිනගර්, ජේදුරුතුඩුව, ඩෙල්ෆ්, නල්ලූර් ආදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය කරමින් ජංගම සේවා පවත්වා ඇත. එකී සේවා අතරින් වාහනයේ සන්තකය මාරු කිරීම, ලියාපදිංචි සහතික අනු පිටපත් නිකුත් කිරීම, අංක තහඩු අයදුම්කරන්නන්ට සේවා සැලසීම, වාහන පන්ති වල තත්ත්ව පරීක්ෂණ කටයුතු හා කාර්මික අංශ වලට අදාළ රාජකාරී, රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ අයදුම්පත් භාර ගැනීම, ලිඛිත පරීක්ෂණ පැවැත්වීම, ප්‍රායෝගික පරීක්ෂණ වලට යොමු කිරීම ආදි සේවාවන් සපයන ලදී.

- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් මොනරාගල දි පවත්වන්නට යෙදුනු V 2025 Enterprises Sri Lanka ප්‍රදර්ශනය සඳහා අප දෙපාර්තමේන්තුවේ ප්‍රදර්ශන කුටියක්ද පවත්වන ලදි.

# 4 පරිපාලනය

## 4.1 දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමාගේ මඟ පෙන්වීම මත කොමසාරිස් (පාලන) විසින් දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙයවනු ලබන අතර කොමසාරිස් (සංවර්ධන) විසින් සංවර්ධන කටයුතු මෙහෙයවනු ලබයි. ඊට අමතරව වේරහැර උප කාර්යාලය ද ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධ වෙමින් කොමසාරිස්වරයකුගේ මූලික මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන අතර අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල දිස්ත්‍රික් ලේකම් වරයකුගේ හෝ සහකාර කොමසාරිස්වරයකුගේ පාලනයට යටත්ව පවතී. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය නාරාහේන්පිට පිහිටා ඇති අතර, වේරහැර උප කාර්යාලය හා දීප ව්‍යාප්තව ස්ථානගත කර ඇති දිස්ත්‍රික් කාර්යාල, ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් මෙහෙයවනු ලබයි.

## 4.2 ප්‍රධාන කාර්යාලයේ අංශ

I. කොමසාරිස් ජනරාල් කාර්යාලය
II. ආයතන ශාඛාව
III. සංවර්ධන ශාඛාව
IV. ගිණුම් ශාඛාව
V. පරිගණක හා තොරතුරු තාක්ෂණ ශාඛාව
VI. අභ්‍යන්තර විගණන හා විමර්ශන ශාඛාව
VII. නීති ශාඛාව
VIII. සුඛෝපභෝගී බදු ශාඛාව
IX. තැපැල් ශාඛාව
X. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව I
XI. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව II
XII. ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව
XIII. යතුරුපැදි නව ලියාපදිංචි ශාඛාව
XIV. මෝටර් කාර් පැවරුම් ශාඛාව
XV. වෙළඳ වාහන පැවරුම් ශාඛාව
XVI. ලොරි පැවරුම් ශාඛාව
XVII. බස් හා ඉඩම් වාහන පැවරුම් ශාඛාව
XVIII. ත්‍රීරෝද රථ පැවරුම් ශාඛාව

XIX. යතුරුපැදි පැවරුම් ශාඛාව
XX. කාර්මික ශාඛාව
XXI. අංක තහඩු (කොළඹ) ශාඛාව
XXII. අංක තහඩු (පිට පළාත්) ශාඛාව
XXIII. ලේඛනාගාර I
XXIV. ලේඛනාගාර II
XXV. සංඛ්‍යාලේඛන ශාඛාව

## 4.3 ප්‍රධාන කාර්යාලයේ අංශයන්ගේ කාර්ය භාරය

### I. කොමසාරිස් ජනරාල් කාර්යාලය

මහජනතාවගේ අවශ්‍යතා පදනම් කර ගනිමින්, එකී අවශ්‍යතාවයන් සපුරාලීම වෙනුවෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමාගේ කාර්යභාරයන් සඳහා සහාය වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වන අතර මෙම අංශය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමාගේ මඟ පෙන්වීම ඔස්සේ ක්‍රියාත්මක වේ.

### II. ආයතන ශාඛාව

"සුභවාදී සිතුවිලි තුළින් ඵලදායී රාජ්‍ය සේවයක්" යන දැක්ම ඔස්සේ ආයතන අංශය ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තුවේ පරිපාලනය භාර කොමසාරිස්ගේ මඟ පෙන්වීම මත මූලික වශයෙන් දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයේ ආයතන හා පරිපාලන කටයුතු ඉටු කිරීම සහ අනෙකුත් යටිතල පහසුකම් ඇතුළු දෙපාර්තමේන්තුවේ නඩත්තු කටයුතු මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන අතර කාර්ය මණ්ඩලය පත් කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම, සේවා දීර්ඝ ලබා දීම, විනය කටයුතු සිදු කිරීම සහ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම ද, ඊට අමතරව වැටුප් වර්ධක අනුමත කිරීම, විවිධ ණය වර්ග අනුමත කිරීම, අග්‍රහාර රක්ෂණ බිල්පත් නිරවුල් කිරීම, ජලය, දුරකථන, විදුලි බිල්පත් පියවීම ද මෙම අංශය තුළින් සිදුකරනු ලබන කාර්යයන් වේ. තැපැල් ශාඛාව හා ලේඛණාගාර I, ලේඛණාගාර II යන අංශයන් වල කටයුතු ද ආයතන අංශයේ පරිපාලනයට යටත්ව ක්‍රියාත්මක වේ.

### III. සංවර්ධන ශාඛාව

“තෘප්තිමත් සේවක සමූහය තුළින්, ඉහළ මහජන ප්‍රසාදයක්” යන ආංශික දැක්ම ඔස්සේ ක්‍රියාත්මක වේ. සංවර්ධන අංශය භාර කොමසාරිස්ගේ මඟ පෙන්වීම මත මෙම අංශය ක්‍රියාත්මක වන අතර වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නංවමින් කාර්යාලීය ඉදිකිරීම් කටයුතු පවත්වාගෙන යාම, සේවක

අභිප්‍රේරණය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, දෙපාර්තමේන්තුවේ සියළු අංශවල සහ ප්‍රාදේශීය කාර්යාල වල ප්‍රගතිය සමාලෝචනය, අමාත්‍යාංශ හා වෙනත් අංශවලට යොමු කළ යුතු සියළුම ප්‍රගති වාර්තා, අයවැය වාර්තා, කාර්ය සාධන වාර්තා, ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු වැනි දෙපාර්තමේන්තුවේ වැදගත් කාර්යයන් රැසක් මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

### IV. ගිණුම් ශාඛාව

"නිවැරදි වුත් විනිවිද වුත් ඵලදායි මූල්‍ය කළමණාකරණයෙන් ආයතනික අභිවෘද්ධිය" යන දැක්ම මුල් කර ගනිමින්, ආදායම් වියදම් පිළිබඳ සියළු කටයුතු ගිණුම්ගත කිරීම සහ මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම, විගණන විමසුම් හා රාජ්‍ය ගිණුම් කාරක සභාවට අදාළ කටයුතු සඳහා වාර්තා සැපයීම, මුදල් රෙගුලාසි 135 යටතේ බලතල පැවරීමට අදාළ කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා සහාය වීම ගිණුම් අංශයේ කාර්යභාරය වේ.

### V. පරිගණක හා තොරතුරු තාක්‍ෂණ ශාඛාව

දෙපාර්තමේන්තු දැක්ම හා මෙහෙවර උදෙසා අවශ්‍ය වන නවීන තාක්‍ෂණික ක්‍රම හඳුන්වා දෙමින් පරිගණක ගත තාක්ෂණික කටයුතු කළමණාකරණය කිරීම සහ අනෙතකුත් අංශ සඳහා අදාළ තාක්‍ෂණික සේවා සැපයීම ප්‍රධාන කාර්යභාරය වන අතර, අවශ්‍ය අවස්ථාවන්හි දී තොරතුරු නිකුත් කිරීම ද මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

### VI. අභ්‍යන්තර විගණන හා විමර්ශන ශාඛාව

"විගණන හා විමර්ශන කටයුතු තුළින් ඉහළ ඵලදායිතාව" යන දැක්ම ඔස්සේ දෙපාර්තමේන්තුවට සියළුම ශාඛා කාර්යාල වල අභ්‍යන්තර විගණන කටයුතු හා විමර්ශනය කිරීම සහ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් පවරන ලද රාජකාරි කටයුතු ඉටු කිරීම අංශයේ කාර්යභාරය වේ.

### VII. නීති ශාඛාව

"සාධාරණත්වය-නීතියට ඉදිරියෙන්" යන දැක්ම ඔස්සේ ක්‍රියාත්මක වෙමින් දෙපාර්තමේන්තුවේ නීතිමය කටයුතු සඳහා දායකත්වය ලබා දෙනු ලබන අතර කාර්යභාරය ලෙස දෙපාර්තමේන්තුවට එරෙහි නඩු පැවරීම් වලදී නීතිපති දෙපාර්තමේන්තුව හා අනෙකුත් පාර්ශව සම්බන්ධීකරණය කරමින් ඒ වෙනුවෙන් පෙනී සිටීම සහ මෝටර් වාහන සම්බන්ධයෙන් වන නීතිමය තත්ත්වයන් සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම සිදු කරනු ලබයි.

**VIII. සුඛෝපභෝගී බදු ශාඛාව**

“විධිමත් බදු කරණය තුළින් ජාතික සංවර්ධනයට උර දීම” යන දැක්ම මත ක්‍රියාත්මක වෙමින් 1995 අංක 16 දරණ මුදල් පනත හා සංශෝධිත පනත් යටතේ සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්යය බදු අයකිරීම සිදුකරන රක්ෂණ ආයතන කළමනාකරණය කිරීම හා මඟ පෙන්වීම, බදු ගෙවීම පිළිබඳ වාහන හිමියන් දැනුවත් කිරීම සහ හිඟ බදු අයකිරීම, බදු ගෙවීම සම්බන්ධව ඒ ඒ වාහන වෙනුවෙන් පරිගණක පද්ධතිය පවත්වාගෙන යාම, බදු ආදායම් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම හා ආදායම් වාර්තා සකස් කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

**IX. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව I හා II**

“වෙළඳ වාහන නව ලියාපදිංචි කිරීම තුළින් මෝටර් වාහන නියාමනයෙන් ඉහළ මහජන ප්‍රසාදය” යන දැක්ම ඔස්සේ ක්‍රියාත්මක වෙමින් විශේෂ කාර්යය වාහන, ද්විත්ව කාර්යය වාහන, මෝටර් ලොරි, මෝටර් කාර් හා ත්‍රිවිධ හමුදා මගින් මිලදී ගන්නා , රාජසන්තක කර වෙන්දේසි කරන ලද වාහන ලියාපදිංචි කර ලියාපදිංචි සහතික නිකුත් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. ඊට අමතරව රජයේ ප්‍රතිපත්ති අනුව වාහන සඳහා ඉදිරි අංක වෙන් කිරීම හා ඒ සඳහා ගාස්තු අයකිරීම සිදුකරනු ලබයි. වසර 2018 දී මෙම අංශය මගින් මෝටර් වාහන 120,319 ක් ලියාපදිංචි කටයුතු සිදුකර ඇත.

**X. ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව**

"ත්‍රී රෝද රථ නව ලියාපදිංචි කිරීම තුළින් මානව හිතවාදී නීති ගරුක සමාජයක්" දැක්ම ඔස්සේ ක්‍රියාත්මක වෙමින් මෙතෙක් ලියාපදිංචි නොවූ ත්‍රීරෝද රථ පළමු වරට ලියාපදිංචි කිරීම සිදු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. ඊට අමතරව තානාපති කාර්යාලයන්හි වාහන පැවරීම ලියාපදිංචිය, එම වාහන වල ලියාපදිංචිය අවලංගු කිරීම සහ එම වාහන රටින් බැහැර ගෙන යාමට අදාළ කාර්යයන් ඉටුකරනු ලැබේ. 2018 වර්ෂය තුළ ත්‍රී රෝද 20,717 ක් මෙම අංශය මගින් ලියාපදිංචි කර ඇත.

**XI. යතුරුපැදි නව ලියාපදිංචි ශාඛාව**

"මහජනතාව වෙත කාල පමාවකින් තොරව විශිෂ්ඨ සේවාවක් සැපයීම" යන දැක්ම ඔස්සේ ක්‍රියාත්මක වෙමින් ශ්‍රී ලංකාව තුළ මෙතෙක් ලියාපදිංචි නොකළ නව යතුරුපැදි ලියාපදිංචි කිරීම හා ඊට අදාළ සියළු කාර්යයන් ඉටු කිරීම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. 2018 වසර තුළ 339,763ක අගයකින් යුත් යතුරුපැදි සංඛ්‍යාවක් ලියාපදිංචි කර ඇත.2017 වසරේ එම අගය 344,380 විය.

## XII. වාහන අයිතිය පැවරීමේ ශාඛා

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ මූලික ලියාපදිංචිය සිදුකර ඇති සියළුම වාහන වල අයිතිය නැවත පැවරීම ලියාපදිංචි කිරීම මෙම ශාඛා තුළින් සිදු කරයි. මෙම වාහන පැවරීමේ කාර්යය සඳහා ඒ ඒ වාහන වර්ගය අනුව පැවරුම් අංශ හයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර ඇත. එනම්,

- ලොරි පැවරුම් අංශය
- කාර් පැවරුම් අංශය
- වෙළඳ වාහනපැවරුම් අංශය
- ත්‍රිරෝද රථ පැවරුම් අංශය
- යතුරුපැදි පැවරුම් අංශය
- බස් හා ඉඩම් වාහන පැවරුම් අංශය

මෙම සෑම අංශයක්ම කොමසාරිස්වරයකුගේ හෝ සහකාර කොමසාරිස්වරයකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන අතර තම කාර්යයන් සාමාන්‍ය සේවා හා එක්දින සේවා පහසුකම් යටතේ සිදු කරනු ලබන අතර මෙම සියළුම අංශයන්ගේ කාර්යභාරය පොදුවේ පහත පරිදි දැක්විය හැක.

* පැවරීම ලියාපදිංචි කිරීම.
* පරම අයිතිය හෝ උකසක් සහිතව පැවරීම ලියාපදිංචි කිරීම.
* පරම අයිතිය හෝ උකසක් අවලංගු කර පැවරීම ලියාපදිංචි කිරීම.
* ලියාපදිංචි සහතිකයේ අනු පිටපත් නිකුත් කිරීම.
* විධිමත් අයුරෙන් සිදු කරන භෞතික වෙනස්කම් මෙන්ම ලේඛනමය වෙනස්කම් ද ලියාපදිංචි සහතිකයේ ඇතුළත් කිරීම.
  උදා :- එංජින් අංකය, වර්ණය, ලිපිනය

* නව ඉංග්‍රීසි අක්ෂර සහිත වාහන වල අංක තහඩු හා ස්ටිකර් වල අනු පිටපත් නිකුත් කිරීම සඳහා දත්ත පරිගණක ගත කිරීම.
* පැවරීමක් සඳහා පැවරුම් ශාඛාවට අයදුම්පත් ඉදිරිපත් කර ඇති වාහන සඳහා ආදායම් බලපත්‍රය ලබා ගැනීමට අවශ්‍ය MTA-11 ලේඛන සනාථ කර නිකුත් කිරීම.
* නෛතික කටයුතු සඳහා අවශ්‍ය වන සහතික කරන ලද පරිගණක උධෘත නිකුත් කිරීම හා ලැබෙන විරෝධතා සටහන් කර ගැනීම.

## XIII. කාර්මික ශාඛාව

වාහන ලියාපදිංචි කිරීමට අදාළව සපයනු ලබන කාර්මික සේවාවන් දෙපාර්තමේන්තුවේ කාර්මික ශාඛාව මඟින් සිදුකරනු ලබන අතර එම කාර්යය ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මෝටර් රථ පරීක්ෂකවරු විසින් සිදුකරනු ලබයි. මෙම සේවාව සඳහා සහකාර කොමසාරිස් (කාර්මික), ප්‍රධාන මෝටර් රථ පරීක්ෂකවරු 14 ක් හා මෝටර් රථ පරීක්ෂකවරු 102කින් සමන්විත වේ. කාර්මික සේවය සඳහා මෙම මෝටර් රථ පරීක්ෂකවරුන් ප්‍රධාන කාර්යාලයේ, වේරහැර උප කාර්යාලයේ හා සියළුම දිස්ත්‍රික් කාර්යාල වලට අනුයුක්ත කර ඇත.

## 4.4 වේරහැර උප කාර්යාලය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව ක්‍රියාත්මක වන වේරහැර උප කාර්යාලය තුළින් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ සියළු කාර්යයන් හා වාහන පරීක්ෂාව, බර සහතික නිකුත් කිරීම හා එයට අදාළ සියළු කටයුතු සිදුකරනු ලබයි. මෙම කාර්යාලයේ සියළු කටයුතු කොමසාරිස්වරයෙකු සහ නියෝජ්‍ය කොමසාරිස්වරයකු මඟින් පාලනය වේ.

## 4.5 දිස්ත්‍රික් කාර්යාල

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය දීප ව්‍යාප්ත කරමින්, සේවාලාභීන්ට තම දිස්ත්‍රික්කය තුළදීම උපරිම සේවයක් ලබාදීමේ අරමුණින්, සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් කාර්යාල පිහිටුවා ඇත. ඒ අතරින් යාපනය හා කුරුණෑගල කාර්යාල නියෝජ්‍ය කොමසාරිස්වරයකු යටතේ හා හම්බන්තොට, අනුරාධපුරය, ගම්පහ කාර්යාල සහකාර කොමසාරිස්වරයකු යටතේ ක්‍රියාත්මක වන අතර අනෙකුත් කාර්යාල අදාළ දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ මෝටර් රථ පරීක්ෂකවරයකු මඟින් පාලනය වේ.

මෙම දිස්ත්‍රික් කාර්යාල මඟින් මූලික වශයෙන් රියදුරු බලපත්‍ර සඳහා අයදුම්පත් භාර ගැනීම, බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීමද සිදු කරනු ලබයි. මේ යටතේ අනුරාධපුරය හා හම්බන්තොට යන දිස්ත්‍රික් කාර්යාල මඟින් රියදුරු බලපත් මුද්‍රණය කර නිකුත් කිරීම සිදු කරනු ලබයි. කුරුණෑගල, ගම්පහ, කළුතර, මොනරාගල, නුවර සහ යාපනය යන දිස්ත්‍රික් කාර්යාල මඟින් රියදුරු බලපත් නිකුත් කිරීම සඳහා අයදුම්පත් භාර ගැනීම පමණක් දැනට සිදු කරනු ලබන අතර, රියදුරු බලපත් නිකුත් කරනු ලබන්නේ වේරහැර කාර්යාලය මඟිනි. අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේදී off line ක්‍රමය භාවිතා කරයි.

මෙම කාර්යයන්ට අමතරව වෙන් කරන ලද අංක මත දිස්ත්‍රික්කයට අදාළ යතුරුපැදි නව ලියාපදිංචි කිරීම, දිස්ත්‍රික්කය තුළ එම යතුරුපැදි පැවරීම ලියාපදිංචි කිරීම, බර සහතික නිකුත් කිරීම හා කාර්මික සේවාවන්ට අදාළ කටයුතු ද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම සඳහා පැවරුම් වලට අදාළ සියළු කටයුතු වෙනුවෙන් අයදුම්පත් භාර ගැනීම ද දිස්ත්‍රික් කාර්යාල මගින් සිදුකරනු ලබයි.

# 5 දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය

දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය පිළිබඳ සලකා බැලීමේදී එය ප්‍රධාන කාර්යය දර්ශන 3 ක් මගින් ඇගයීම් කළ හැක. එනම්,

- දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මහජන සේවාවන් වල සංඛ්‍යාත්මක ප්‍රගතිය.
- වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය.
- අයවැය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය.

## 5.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මහජන සේවාවන් වල සංඛ්‍යාත්මක ප්‍රගතිය

මෙම කාර්යය සාධන දර්ශකය මගින් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ගේ ප්‍රගතිය දැක්විය හැකි අතර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් කාණ්ඩ 06 ක් යටතේ වර්ගීකරණය කළ හැක. එනම්,

1. ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය
2. වාහන හිමිකම් පැවරීම ලියාපදිංචි කිරීම
3. රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව
4. මෝටර් වාහන සම්බන්ධ කාර්මික සේවාව
5. වායු විමෝචන තත්ත්වය නියාමන කාර්යය
6. මාර්ග ආරක්ෂාව පිළිබඳ කාර්යයන්

### 5.1.1 ධාවනය කළ හැකි මෝටර් වාහන නව ලියාපදිංචිය

මෙරටට ආනයනය කරන ලද හෝ මෙරට නිෂ්පාදනය කරන ලද හෝ එකලස් කරන ලද වාහන ශ්‍රී ලංකාව තුළ ප්‍රථමවරට ලියාපදිංචි කිරීම මෙම කාර්යය යටතේ සිදු කරනු ලබයි. මෙම ලියාපදිංචි කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 04 මගින් සිදු කරනු ලබයි.

එනම්,

1. යතුරුපැදි නව ලියාපදිංචි ශාඛාව
2. ත්‍රීරෝද රථ නව ලියාපදිංචි ශාඛාව

3. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව I (කාර්, ලොරි, ද්විත්ව කාර්යය වාහන, සින්ගල් කැබ්, ප්‍රයිමුවර්, අවමංගල්‍ය රථ සහ ගිලන් රථ)
4. වෙළඳ වාහන නව ලියාපදිංචි ශාඛාව II (බස් රථ , ට්‍රැක්ටර්)

මෙම වාහන වල පළමු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීමේ දී අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලිපි ලේඛන වල නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ලියාපදිංචි ගාස්තු -ගෙවීමෙන් පසු එක් දිනකින් ලියාපදිංචි කටයුතු අවසන් කර අදාළ ලියාපදිංචි සහතිකය නිකුත් කරනු ලබයි.

2018 වර්ෂය තුළ ලියාපදිංචි නව මෝටර් වාහන ප්‍රමාණය 480,799 ක් වන අතර ඒ අනුව මුළු මෝටර් වාහන ගහනය 7,726,993ක් වේ. ලියාපදිංචි නව වාහන ප්‍රමාණය වසර 2017 ට සාපේක්ෂව 6.45%ක වැඩි වීමකි. එම සංඛ්‍යාත්මක අගයන් පහත ලෙස සාරාංශ කළ හැක.


**5.1.1.1 වගුව :- වාහන ගහනය**

| වර්ෂය | නව ලියාපදිංචි වූ වාහන සංඛ්‍යාව | මුළු වාහන ගහනය |
|---|---|---|
| **2011** | 525,421 | 4,479,732 |
| **2012** | 397,295 | 4,877,027 |
| **2013** | 326,651 | 5,203,678 |
| **2014** | 429,556 | 5,633,234 |
| **2015** | 668,907 | 6,302,141 |
| **2016** | 493,328 | 6,795,469 |
| **2017** | 451,653 | 7,247,122 |
| **2018** | 480,799 | 7,727,921 |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

2018 වර්ෂයේ නව ලියාපදිංචි වූ වාහන සංඛ්‍යාව පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ.


**5.1.1.1රූපසටහන**




**මූලාශ්‍රය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකාවේ වාහන නව ලියාපදිංචිය සලකා බැලීමේ දී වසර 2017 වර්ෂයට වඩා 2018 වර්ෂයේ වැඩිවීමක් සිදුවී ඇත.

**5.1.1.2 රූපසටහන**




මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව


**5.1.1.2 වගුව :- නව ලියාපදිංචි වාහන කාණ්ඩ**

| වාහන පන්තිය | **2017.12.31** දිනට වාහන | **2018.12.31** දිනට වාහන | වැඩිවීම/අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| මෝටර් කාර් | 39,182 | 80,776 | 106.16 |
| ත්‍රීරෝද රථ | 23,537 | 20,063 | -14.76 |
| මෝටර් සයිකල් | 344,380 | 339,763 | -1.34 |
| මෝටර් බස් | 3,331 | 2,957 | -11.23 |
| ද්විත්ව කාර්යය වාහන | 16,742 | 16,931 | 1.13 |
| මෝටර් ලොරි | 11,432 | 9,371 | -18.03 |
| ඉඩම් වාහන ට්‍රැක්ටර් | 8,821 | 7,460 | -15.43 |
| ඉඩම් වාහන (ට්‍රේලර්) | 4,228 | 2,822 | -33.25 |
| ක්‍රොඩ් සයිකල් | - | 654 | 0.00 |
| මෝටර් නිවාස | - | 2 | 0.00 |
| එකතුව | **451,653** | **480,799** | **6.45** |

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

## 2018 වසරේ ලියාපදිංචි වූ නව වාහන කාණ්ඩ

### 5.1.1.3 රූප සටහන




**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**


2017 වර්ෂයට සාපේක්ෂව වාහන ලියාපදිංචිය සලකා බැලීමේදී බොහෝ වාහන කාණ්ඩවල සංඛ්‍යාත්මක අගයන්ගේ පහළ යාමක් දැකිය හැක.ඉහත වාහන ලියාපදිංචියේ සංඛ්‍යාත්මක අගයන් සලකා බැලීමේදී මෝටර් කාර්, ත්‍රීරෝද රථ හා යතුරු පැදි ලියාපදිංචිය තුළින් ලංකාව තුළ ඉහළ යන වාහන ගහණය සඳහා ඉහළ දායකත්වයක් ලබා දෙන බව පෙන්වා දිය හැක.එම වාහන කාණ්ඩ 3හි ලියාපදිංචිය පහත සඳහන් පරිදි වෙන් වෙන් වශයෙන් දැක්විය හැකිය.

## 2018 වර්ෂයේ මෝටර් කාර් නව ලියාපදිංචිය

### 5.1.1. 3 වගුව - නව ලියාපදිංචි මෝටර් කාර් දත්ත

| මාසය | වාහන ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 6,016 |
| පෙබරවාරි | 5,648 |
| මාර්තු | 6,917 |
| අප්‍රේල් | 6,780 |
| මැයි | 8,129 |
| ජුනි | 7,793 |
| ජූලි | 8,147 |
| අගෝස්තු | 8,223 |
| සැප්තැම්බර් | 6,210 |
| ඔක්තෝබර් | 7,935 |
| නොවැම්බර් | 5,018 |
| දෙසැම්බර් | 3,960 |

### 5.1.1.4 රූප සටහන





**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

## 5.1.1.4 වගුව - නව ලියාපදිංචි මෝටර් කාර් දත්ත (2011-2018)

| වර්ෂය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| ලියාපදිංචි වූ මෝටර් කාර් සංඛ්‍යාව | 57,886 | 31,546 | 28,380 | 38,780 | 105,628 | 45,172 | 39,182 | 80,776 |

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### 5.1.1.5 රූප සටහන





මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

## යතුරු පැදි නව ලියාපදිංචිය

### 5. 1.1.5 වගුව :- නව ලියාපදිංචි යතුරු පැදි දත්ත

| මාසය | වාහන ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 31,709 |
| පෙබරවාරි | 27,831 |
| මාර්තු | 30,405 |
| අප්‍රේල් | 29,667 |
| මැයි | 33,674 |
| ජූනි | 26,411 |
| ජූලි | 29,053 |
| අගෝස්තු | 30,135 |
| සැප්තැම්බර් | 24,119 |
| ඔක්තෝබර් | 31,156 |
| නොවැම්බර් | 22,568 |
| දෙසැම්බර් | 23,035 |

### 5.1.1.6 රූප සටහන





මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**5.1.1.6** වගුව :- නව ලියාපදිංචි යතුරු පැදි දත්ත (2011-2018)

| වර්ෂය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| ලි.ප. යතුරුපැදි සංඛ්‍යාව | 253,331 | 192,284 | 169,280 | 272,885 | 370,889 | 340,129 | 344,380 | 339,763 |

මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**5.1.1.7** රූප සටහන





මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**ත්‍රීරෝද රථ නව ලියාපදිංචිය**

**5.1.1.7** වගුව :- නව ලියාපදිංචි වූ ත්‍රීරෝද රථ

| මාසය | වාහන ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 1,685 |
| පෙබරවාරි | 1,559 |
| මාර්තු | 1,629 |
| අප්‍රේල් | 1,520 |
| මැයි | 1,381 |
| ජූනි | 2,160 |
| ජූලි | 1,810 |
| අගෝස්තු | 1,820 |
| සැප්තැම්බර් | 1,554 |
| ඔක්තෝබර් | 2,079 |
| නොවැම්බර් | 1,449 |
| දෙසැම්බර් | 1,417 |

**5.1.1.8** රූප සටහන





මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු

**5.1.1.8 වගුව :- නව ලියාපදිංචි වූ ත්‍රිරෝද රථ (2011-2018)**

| වර්ෂය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| ලි.ප. ත්‍රිරෝද රථ සංඛ්‍යාව | 138,426 | 98,815 | 83,673 | 79,038 | 129,547 | 56,945 | 23,537 | 20,063 |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

**5.1.1.9 රූප සටහන**





**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

අලුතින් ලියාපදිංචි වන මෙම වාහන භාවිතා කරනු ලබන ඉන්ධන වර්ගය අනුව ප්‍රධාන වශයෙන් කාණ්ඩ 03 ක් යටතේ වර්ග කළ හැක. එනම්,

- පෙට්‍රල් භාවිතා කරන වාහන
- ඩීසල් භාවිතා කරන වාහන
- වෙනත්
  - පෙට්‍රල්/ ඉලෙක්ට්‍රිකල් වාහන
  - ඩීසල් / ඉලෙක්ට්‍රිකල් වාහන
  - ඉලෙක්ට්‍රිකල් වාහන
  - ඉන්ධන භාවිතා නොකරන වාහන

**5. 1.1.10 රූප සටහන**





**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

2018 වර්ෂය තුළ පෙට්‍රල් භාවිතයෙන් ධාවනය වන වාහන 409,007 ක් ද ඩීසල් භාවිතයෙන් ධාවනය වන වාහන 31,615 ක් ද ලියාපදිංචි වී ඇති අතර ඉන්ධන භාවිතයක් රහිත වාහන 3,127ක් ද ලියාපදිංචි වී ඇත. පෙට්‍රල් භාවිතයෙන් ධාවනය වන වාහන ලෙස ලියාපදිංචි වූ වාහන ප්‍රමාණය ලියාපදිංචි වූ මුළු වාහන ප්‍රතිශතයෙන් 85% කි. ඩීසල් වාහන ප්‍රමාණය 7% කි.

## 1.1.2 වාහන හිමිකම පැවරීම ලියාපදිංචි කිරීම

ලියාපදිංචි කළ වාහන නැවත පැවරීම ලියාපදිංචි කිරීම සලකා බැලීමේ දී වසර 2018 දී සමස්ථ පැවරුම් සංඛ්‍යාව 668,295 ක් වී ඇත. වාහන පැවරුම් වල සිදු වූ වර්ධනයේ ප්‍රවණතාවය පහත රූප සටහන තුළින් දැක්විය හැක.

**5. 1.2.1 රූප සටහන**




**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**


ඉහත රූප සටහනට අනුව වසර 2017 දී සිදුකරන ලද 708,201 පැවරුම් සංඛ්‍යාවට සාපේක්ෂව 2018 දී සමස්ථ පැවරුම් සංඛ්‍යාව 668,295 කි. එය -5.97%ක ඍණ අගයක් වේ. නව ලියා පදිංචිය හා සලකා බැලීමේ දී පැවරුම් සංඛ්‍යාව ඉහළ ගොස් ඇත.

**2018 වසරේ පැවරුම් ප්‍රමාණය ඒ ඒ වාහන කාණ්ඩ අනුව පහත පරිදි වෙන් කර දැක්විය හැක.**

**5.1.2.1** වගුව :- වාහන පැවරුම් සංයුතිය

| වාහන වර්ගය | 2017 | 2018 |
|---|---|---|
| කාර් පැවරුම් | 130,027 | 137,912 |
| ත්‍රීරෝද රථ පැවරුම් | 218,918 | 215,926 |
| යතුරු පැදි පැවරුම් | 175,001 | 135,865 |
| වෙළඳ වාහන පැවරුම් | 97,345 | 96,640 |
| ලොරි පැවරුම් | 56,749 | 51,962 |
| බස් පැවරුම් | 18,082 | 18,163 |
| ඉඩම් වාහන පැවරුම් | 12,079 | 11,827 |
| එකතුව | 708,201 | 668,295 |

**5. 1.2.2** රූප සටහන




මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

## 5.1.3 රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ සේවාව

රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාපිළිවෙල හා එහි ස්වභාවය දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට අවස්ථා ගණනකදී විකාශනය වෙමින් වර්තමානයේ නිකුත් කරනු ලබන ජාත්‍යන්තර ප්‍රමිතියකින් යුතු නව ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රය දක්වා විකාශනය වී ඇත. මෙම ස්මාර්ට් කාඩ් රියදුරු බලපත්‍රය ව්‍යාජ ලෙස මුද්‍රණය කිරීම වැළැක්වීම සඳහා උසස් තත්ත්වයේ ආරක්ෂණ උපක්‍රම භාවිතා කර ඇති අතර, මෙහි බලපත්‍ර දරන්නාගේ රුධිර ගණයද ඇතුළත් කර ඇත. වේරහැර උපකාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල හරහා රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ආකාර දෙකක් මගින් සිදු කරනු ලබයි.

එනම්,

1. On line (මාර්ග ගත සම්බන්ධතාවය)

   වේරහැර කාර්යාලය කේන්ද්‍ර කර ගනිමින් හම්බන්තොට, අනුරාධපුර, ගම්පහ, කළුතර, කුරුණෑගල, මොනරාගල, යාපනය හා මහනුවර යන දිස්ත්‍රික් කාර්යාල වල ක්‍රියාත්මකවේ.

2. Off Line ( මාර්ගගත නොවන සම්බන්ධතාවය)

අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ දී මෙම ක්‍රමය අනුගමනය කරනු ලබයි.

**5.1.3.1 වගුව**

| මාසය | ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 68,613 |
| පෙබරවාරි | 62,327 |
| මාර්තු | 64,835 |
| අප්‍රේල් | 56,679 |
| මැයි | 66,012 |
| ජූනි | 70,034 |
| ජූලි | 65,439 |
| අගෝස්තු | 70,484 |
| සැප්තැම්බර් | 53,289 |
| ඔක්තෝබර් | 100,243 |
| නොවැම්බර් | 67,576 |
| දෙසැම්බර් | 61,069 |
| එකතුව | 806,600 |

❖ 2018 දෙසැම්බර් 31 දින දක්වා නිකුත් කර ඇති මුළු රියදුරු බලපත් සංඛ්‍යාව **806,600ක්** වන අතර එය පහත සඳහන් ලෙස වර්ග කර දැක්විය හැක.

**5.1.3.2 වගුව**

| වර්ගය | 2018.12.31 දිනට |
|---|---|
| පරිවර්තන | 47,075 |
| සංශෝධන | 39,325 |
| අනු පිටපත් | 47,937 |
| වාහන පංති එකතු කිරීම | 64,560 |
| විදේශ රියදුරු බලපත්‍ර පරිවර්තන | 3,354 |
| නව රියදුරු බලපත්‍ර | 339,078 |
| අලුත් කිරීම | 265,271 |
| එකතුව | 806,600 |

**මූලාශ්‍රය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

වේරහැර කාර්යාලයේ රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමට අමතරව හම්බන්තොට හා අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාල සඳහා රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ යන්ත්‍ර ස්ථාපනය කර ඇත.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තොරතුරු තාක්ෂණයෙන් තවත් ඉදිරි පියවරක් තබමින් රියදුරු බලපත්‍ර ලිඛිත විභාගය පරිගණක ආශ්‍රයෙන් (Touch Screen) ක්‍රියාත්මක කිරීමට අභිනවයෙන් සකස් කළ පරිගණක ආශ්‍රිත ශාලාව සේවාලාභීන් සඳහා 2018 ජූලි 12 දින සිට විවෘත කරන ලදි.

දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා කඩිනමින් ඉටු කිරීමට මෙන්ම වඩා විනිවිද භාවයකින් යුතුව විභාගය පැවැත්වීමට ගත් තවත් එක් ඉදිරි පියවරක් ලෙස මෙය සැලකේ. මෙහිදී අදාළ අපේක්ෂකයා පරිගණක තිරයේ (Touch Screen) හී දිස්වන ප්‍රශ්න වලට පිළිතුරු සැපයූ පසු අදාළ කාලය අවසන් වූ වහාම තම ප්‍රතිඵලය පරිගණකය මඟින් ක්ෂණිකව තමාටම දැන ගැනීමට ලැබීම තවත් ඇති සුවිශේෂත්තවයකි. ඉදිරියේදී මෙම ක්‍රමය සියලු දිස්ත්‍රික් කාර්යාල වෙතද ලබාදීමට බලාපොරොත්තු වේ.

එමෙන්ම, අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ප්‍රායෝගික පරීක්ෂණ බාහිර පාර්ශව වෙතින් ඉටු කරවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය හා ශ්‍රී ලංකා ඔටෝ මොබයිල් ඇසෝසියේෂන් ආයතනය විසින් ඉටු කරවා ගැනීමට සුදුසු ක්‍රමවේදය සඳහා වූ කෙටුම්පත ඉදිරිපත් කර ඇත.





පරිගණක ආශ්‍රයෙන් (TOUCH SCREEN) රියදුරු බලපත්‍ර ලිඛිත පරීක්ෂණය ආරම්භ කිරීම

### 5.1.4 කාර්මික සේවාව

කාර්මික සේවාව සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයෙන් වේරහැර උප කාර්යාලයෙන් හා සියළුම දිස්ත්‍රික් කාර්යාල වලින් සිදු කරන කාර්යයන් පොදුවේ පහත ලෙස දැක්විය හැක.

- මෝටර් වාහන පනත අනුව නීතිරීති රෙගුලාසි සකස් කිරීම හා සංශෝධන කටයුතු සඳහා සහය වීම.
- රියදුරු බලපත්‍ර සම්බන්ධ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම.
- වාහන පරීක්ෂාකර බර සහතික නිකුත් කිරීම, අනන්‍යතා සහතික නිකුත් කිරීම.
- රජයේ වාහන සඳහා යෝග්‍යතා සහතික නිකුත් කිරීම.
- වාහන සම්බන්ධ ටෙන්ඩර් මණ්ඩල සඳහා සහභාගී වීම, වාහන ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා නිර්දේශ ලබා දීම.
- කාර්මික ගරාජ ලියාපදිංචි කිරීම් සහ වාර්ෂික බලපත්‍ර අලුත් කිරීම.
- CMT වැසි අංක, ට්‍රේලර වැසි අංක නිකුත් කිරීම.
- රියදුරු උපදේශක පාඨමාලා සහ අනෙකුත් පුහුණු පාඨමාලා සකස් කර ක්‍රියාත්මක කිරීම.
- බරපතල අනතුරු සම්බන්ධ වාහන පරීක්ෂා කර, නිරීක්ෂණ අධිකරණය වෙත වාර්තා කිරීම.

ප්‍රධාන කාර්යාලය ඇතුළු අනිකුත් කාර්යාල වලින් සිදුකරනු ලබන කාර්මික සේවාවන් ප්‍රධාන කාණ්ඩ විස්සක් (20) යටතේ වර්ග කර දැක්විය හැකි අතර එම එක් එක් කාණ්ඩයන්ට අදාළ සංඛ්‍යාත්මක දත්ත පහත 5.1.4.1වගුව මඟින් සාරාංශ කර පහත පරිදි දැක්විය හැක.

### 5.1.4.1 වගුව

| | කාර්යය | 2017 | 2018 |
|---|---|---|---|
| 1 | රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ලිඛිත පරීක්ෂණ පැවැත්වීම | 432,553 | 479,615 |
| 2 | රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම | 763,590 | 693,478 |
| 3 | අංක තහඩු නිකුත් කිරීම (කොළඹ) | 486411 | 587,097 |
| 4 | අංක තහඩු නිකුත් කිරීම (පිට පළාත්) | 156225 | 148,758 |
| 5 | ගරාජ, නව වෙළඳ ආයතන පරීක්ෂා කිරීම | 75 | 258 |
| 6 | ගරාජ, නව වෙළඳ ආයතන ලියාපදිංචි කිරීම | 86 | 251 |
| 7 | ගරාජ, නව වෙළඳ ආයතන අලුත් කිරීම | 971 | 869 |
| 8 | රියදුරු පාසල් පරීක්ෂා කිරීම | 67 | 14 |
| 9 | මූලාකෘති නිකුත් කිරීම | 532 | 128 |
| 10 | C.M.T. වැසි අංක නිකුත් කිරීම | 5 | 21 |
| 11 | ට්‍රේලර් වැසි අංක නිකුත් කිරීම | 3,790 | 2,290 |
| 12 | රේගු වෙන්දේසි වාහන සඳහා C.M.T. වැසි අංක නිකුත් කිරීම | 3 | 34 |
| 13 | යතුරුපැදි පරීක්ෂා කිරීම | 560 | 532 |
| 14 | නව යතුරුපැදි පරිගණක ගත කිරීම | 0 | 0 |
| 15 | බර සහතික නිකුත් කිරීම | 11,020 | 10,215 |
| 16 | අනන්‍යතා සහතික නිකුත් කිරීම | 1794 | 1,384 |
| 17 | තහනම් නියෝග නිකුත් කිරීම | 1575 | 2,012 |
| 18 | තහනම් නියෝග ඉවත් කිරීම | 1504 | 1,637 |
| 19 | රිය අනතුරු පරීක්ෂා කිරීම | 5,837 | 5,713 |
| 20 | විශේෂ රාජකාරි සඳහා සහභාගී වීම | 338 | 407 |

### 5.1.5 වායු විමෝචන පරීක්ෂණ කාර්යයන් නියාමනය කිරීම.

වායු දූෂණය වළක්වමින් ඒ සඳහා දායකවන වාහන වලින් පිටවන දුම පාලනය කිරීමේ පරමාර්ථයෙන් 2008 ජනවාරි මස 25වන දින නිකුත් කරන ලද අංක 1533/17 දරණ අතිවිශේෂ ගැසට් නියෝගයත්, 2009 අංක 08 මෝටර් වාහන (සංශෝධන) පනත හා අංක 1557/14 ජාතික පරිසර (වායු විමෝචන ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති ) අති විශේෂ ගැසට්පත්‍රය අනුව 2008 නොවැම්බර් මස 17 දින සිට ක්‍රියාත්මක වන පරිදි වායු විමෝචන පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදි. එසේම නව ප්‍රමිතීන් 2014.11.05 දින ප්‍රකාශයට පත් කර ඇති අතර එම ප්‍රමිතීන් 2016 සැප්තැම්බර් 15 වන දින සිට ක්‍රියාත්මක කර ඇති අතර පුවත්පත් දැන්වීම් හා ප්‍රජා දැනුවත් කිරීම් සිදු කරන ලදී.

වායු විමෝචන වැඩසටහන ක්‍රියාත්මක කරන නව කොන්ත්‍රාත්කරුවන් බඳවා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර ඇති අතර 13 දෙනෙකුගෙන් යුතු ව්‍යාපෘති කමිටුවක් ඔස්සේ නව යෝජනා කැඳවීම් ලියවිල්ල සකස් කර එම ක්‍රියාවලිය ඉදිරියට සිදු කරමින් පවතී.

එසේම ජංගම වායු තත්ත්ව පරික්ෂා කිරීමට උපකරණ ප්‍රසම්පාදන කිරීමට ද කටයුතු යොදා ඇති අතර පේරාදෙණිය හා මොරටුව විශ්වවිද්‍යාල හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සමඟ වායු තත්ත්වය මැනීමේ හා ආදාළ වන පර්යේෂණ කටයුතු සිදු කරමින් පවතී.

ලියාපදිංචි වන අධික වාහන සංඛ්‍යාව හේතුවෙන් නාගරික හා අර්ධ නාගරික පෙදෙස් තුළ ඇති වන වායු දූෂණය අවම කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන වායු විමෝචන නියාමන වැඩසටහන් තව දුරටත් සවිබල ගන්වා ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාහන පරික්ෂාව සඳහා දුම් පරීක්ෂණ උපකරණ 10ක් ප්‍රසම්පාදනය කර ඇති අතර, එම උපකරණ බෙදා දීමත් එම පරීක්ෂණ දත්ත ජාල ගත කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට හා සුදුසු ඩිපෝ ස්ථාන හා එම ක්‍රියාවලිය කිරීමට සුදුසු නිලධාරින් පුහුණු කිරීමටද කටයුතු යොදා ඇත.

මාර්ගයේ ධාවනය වන වාහන පරීක්ෂා කිරීම සඳහා කණ්ඩායම් වශයෙන් මාර්ගස්ථ පරීක්ෂාවන් හා ස්ථානීය පරික්ෂාවන් සිදු කරයි. එහිදි මාර්ගස්ථ පරික්ෂාවන් 4518 ක් මේ වසරේ ජනවාරි සිට දෙසැම්බර් 31 දින දක්වා සිදු කර ඇත. එම කාලපරිච්ඡේදය තුළ දුම් සහිත වාහන 1834ක් හඳුනාගත් අතර එම වාහන අයිතිකරුවන්ව දැනුවත් කර එම වාහන පරික්ෂා කිරීමට කටයුතු යොදන ලදී. එමෙන්ම, ස්ථානීය දුම් පරික්ෂාවන් 3015ක් මෙම කාලපරිච්ජේදය තුළ සිදු කර ඇත.

ඊට අමතරව වායු විමෝචන පරික්ෂණ දත්ත කළමනාකරණය සඳහා online දත්ත එකතු කිරීමේ පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු යොදා ඇති අතර එම දත්ත වලින් e – revenue license ලබා ගැනිමේ හැකියාව ලැබී ඇත. තවද 2018.01.01 දින සිට 2018.12.31 දින වන විට ක්ලින්කෝ ලංකා හා ලාෆ්කෝ ශ්‍රී ආයතන දෙක මඟින් මෝටර් රථ ප්‍රවාහන දොපර්තමේන්තුවේ වායු විමෝචන අංශයේ නියාමනය යටතේ මධ්‍යස්ථාන 431ක දුම් පරීක්ෂණ කටයුතු සිදු කරයි. දැනට මධ්‍යස්ථාන 358ක් පරීක්ෂා කර ඇති අතර, ඒවායේ හඳුනාගත් පොදු ගැටළු වනුයේ අර්ධ ස්ථාවර සහ ජංගම මධ්‍යස්ථාන වල පාරිභෝගිකයින් සඳහා ප්‍රමාණවත් ඉඩකඩ හා පහසුකම් සහිත නොවීම, දූෂ්‍ය පරික්ෂණ නිසියාකාරව සිදු නොකිරීම, පරීක්ෂණ පටිපාටිය උල්ලංඝණය කිරීම, වායු විමෝචන පරීක්ෂණ උපකරණ නිසි ලෙස ක්‍රියාත්මක නොවීම, වායු විමෝචන පරීක්ෂණ නිසි ලෙස නඩත්තුව හා ක්‍රමාංකනය කර නොමැති අවස්ථා හා පරීක්ෂණ උපකරණ ක්‍රියා විරහිත වූ විට අමතර පරීක්ෂණ උපකරණ නොමැතිවීම පෙන්වා දිය හැක.

එමෙන්ම, සංසරණ වායු තත්ත්ව පරීක්ෂා කිරීම සඳහා උපකරණ ප්‍රසම්පාදනය අවසන් කර ඇති අතර, එම වායු තත්ත්ව මැනීමේ ස්ථිර මධ්‍යස්ථාන දෙක මධ්‍යම පරිසර අධිකාරියේ පරිශ්‍රය තුළ හා මහනුවර නගරයේ ස්ථාපිත කර ඇති අතර, ජංගම ඒකකයද වායු තත්ත්ව මැනීම සඳහා සකස් කර ඇත. එම උපකරණ වලින් වායු තත්ත්වය මැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත එම උපකරණ විධිමත් පරිදි භාරදීම සඳහා කටයුතු කරගෙන යමින් පවතී. මෙම උපකරණ වලින් ලබාගන්නා ලද දත්ත වාහන වායු විමෝචන පරීක්ෂණ වැඩ සටහනෙහි ප්‍රතිඵල අධ්‍යයනය කිරීම සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.






**මොණරාගල පැවැත්වූ V2025 – Enterprise Sri Lanka ප්‍රදර්ශනය කුටිය**

## 5.1.6 මාර්ග ආරක්ෂාව පිළිබඳ කාර්යයන්

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්ට අමතරව මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා බාහිර ආයතන සමඟ ඒකාබද්ධව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව මේ වන විට ප්‍රධාන නියමු ව්‍යාපෘති කිහිපයක් පවත්වාගෙන යනු ලබන අතර
එනම්,

- මගී ප්‍රවාහන රියදුරු බලපත්‍ර නියෝග ක්‍රියාත්මක කිරීමේ පුහුණු වැඩමුළු පැවැත්වීම
- ධාවනයට නුසුදුසු වාහන සම්බන්ධව පරීක්ෂා කර එම වාහන මාර්ග වලින් ඉවත් කිරීම සම්බන්ධ කාර්යයන් හීදි සම්පත් දායකත්වය ලබාදීම
- මුදල් කොමිෂන් සභාව මඟින් මාර්ග නීති පිළිබඳව වාහන නඩත්තුව සහ ඔවුන්ගේ කාර්ය භාරය පිළිබඳව සම්පත් දායකත්වය ලබාදීම
- ලංකා විදුලි බල මණ්ඩලයේ මාර්ග නීති හා වාහන සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළුව සඳහා සම්පත් දායකත්වය ලබාදීම
- රථ වාහන පාලනය හා මාර්ග ආරක්ෂාව සඳහා කළමනාකරණ පාඨමාලා පැවැත්වීම

- මාර්ග ආරක්ෂාව පිළිබඳව ජාතික සභාව මඟින් පවත්වන ලබන පාඨමාලා මෙහෙයවීම හා සම්පත්දායකත්වය ලබාදීම
- තහනම් නියෝග නිකුත් කිරීම
- ත්‍රී රෝද රථ හිමියන් සඳහා වැඩමුළු පැවැත්වීම

## 5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

### 5.2.1 රියදුරු අභිවෘද්ධි ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

2017 අංක 18 දරණ මෝටර් වාහන (සංශෝධන) පනත මඟින් රියදුරු අභිවෘද්ධි ලකුණු ක්‍රමයේ නම **" රියදුරු අවාසිසහගත ලකුණු ක්‍රමය"** ලෙස සංශෝධනය කිරීම, අනෙකුත් දණ්ඩන වලට අමතරව අවාසිසහගත ලකුණු ඇතුළත් කිරීමට නියෝග කිරීමේ නිශ්චිත ප්‍රතිපාදන ගරු මහේස්ත්‍රාත්වරුන් වෙත ලබාදීම හා අවාසිසහගත ලකුණු ඇතුලත් කිරීමේ බලය පොලිස්පති හරහා පොලිස් නිලධාරින් වෙත ලබාදීමට හැකිවන පරිදි මෝටර් වාහන පනතේ 133 "අ" සහ "ආ" වගන්ති සංශෝධනය කර ඇත.

රියදුරු අවාසිසහගත ලකුණු ක්‍රමය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා පොලිසියට එම ලකුණු ඇතුළත් කළ හැකි වන පරිදි අදාළ පරිගණක වැඩසටහන් සකස් කර ගැනීමට සිදුවේ. මේ සම්බන්ධව මත්ද්‍රව්‍ය පාලනය හා අනතුරු අවම කිරීම සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන සාකච්ඡා වලදීද විමසීමට ලක්වන අතර, ඒ සම්බන්ධව වගකිව යුතු පාර්ශව වල සහභාගිත්වයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2018.12.07 දින පැවැති සාකච්ඡාවේදී එළඹි තීරණ ප්‍රකාරව "රථ වාහන වැරදි සම්බන්ධ දත්ත හා තොරතුරු කළමනාකරණය, ක්ෂණික දඩ මුදල් එකතු කිරීම හා රියදුරු අවාසි සහගත ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරිම සඳහා පුළුල් ඒකාබද්ධ ඉලෙක්ට්‍රොනික විසඳුමක් ක්‍රියාත්මක කිරීම" මැයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මඟින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ගොනු කිරිමට නියමිත බව වාර්තා විය. එමෙන්ම එම ක්‍රමවේදයට අනුකූලව අවාසි සහගත ලකුණු ඇතුළත් කිරීම හා සම්බන්ධ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා 1726/12 හා 2011.01.05 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රියදුරු අභිවෘද්ධි ලකුණු නියෝග සංශෝධනය කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශය, මෙම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරින්ගේ සහභාගිත්වයෙන් මුලික සාකච්ඡාවක් සිදුකර මුලික කෙටුම්පතක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

### 5.2.2. ඉ - මෝටරින් ව්‍යාපෘතිය

වාහන ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගනිමින් වඩාත් කඩිනම් සේවාවක් සැපයීම මෙම ඉ-මෝටරින් ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. මීට අදාළ ක්‍රියාවලිය ප්‍රති නිර්මාණය කිරීමේ වැඩ සටහනක් (Business process Re-engineering - BPR) සම්පූර්ණ කරන ලද අතර, එහිදී හඳුනාගත් නව ක්‍රියාවලීන්ට අනුව ඉ-මෝටරින් ව්‍යාපෘතිය නිර්මාණය කිරිමට නියමිතයි.

ප්‍රති නිර්මාණය කළ නව ක්‍රියාවලින් පහත පරිදි වේ.

1. වාහන ආනයන කරුවන්, වාහන නිෂ්පාදකයන් හා වාහන ලියාපදිංචිය
2. වාහනයේ පළමු අයිතිකරු ලියාපදිංචිය
3. වාහනයේ අයිතිය වෙනස් කිරිම හා වාහනයේ අනිකුත් වෙනස් කිරීම් ලියාපදිංචිය
4. වාහන බදු එකතු කරන ආයතන හා සේවාවන් සපයන්නන් මෙහෙයවීම
5. පැමිණිලි විමර්ශන හා විරෝධතා මෙහෙයවීමේ ක්‍රියාවලිය
6. ලේඛන කළමනාකරණ ක්‍රියාවලිය

මීට අදාළ කටයුතු දැනමටත් ආරම්භ කර ක්‍රියාත්මක කර ඇති අතර, 2018.05.20 දින ව්‍යාපෘතිය තෝරා ගන්නා ලද මෙට්‍රොපොලිටන් ඇඩ්වාන්ස් ටෙක්නොලොජි පුද්ගලික සමාගමට ලබාදීම සඳහා කැබිනට් අනුමැතිය ලද අතර, තෝරා ගත් සමාගම වෙත ව්‍යාපෘති ප්‍රදාන පත්‍රය (Award Letter) 2018.05.31 දින නිකුත් කරන ලදි. එමෙන්ම මේ වනවිට ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇත .

2018 අගෝස්තු 15 දින සිට දෙපාර්තමේන්තු නිලධාරින් හා මෙට්‍රොපොලිටන් ආයතනයෙහි පද්ධතිය සංවර්ධනය කරන නිලධාරින් අතර, BPR (Business Process Reengineering) අනුව නව මෘදුකාංග පද්ධතිය සකස් විය යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා පැවැත්වුණි. BPR අනුව නව මෘදුකාංග පද්ධතියේ සියලු ක්‍රියාවලීන් කොටස් 6කට බෙදා ඇති බැවින්, ඒ එක් එක් කොටස සංවර්ධනය කිරීමට අවශ්‍ය කරුණු හා පැහැදිලි කිරීම් දෙපාර්තමේන්තු නිලධාරින් මඟින් මෙට්‍රොපොලිටන් නිලධාරින් වෙත ලබා දී ඇත.

## 5.3 අයවැය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාග්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය

- දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන ඉහළ ප්‍රාග්ධනයක් දරනු ලබන ව්‍යාපෘතීන් ලෙස,
    - ප්‍රධාන කාර්යාලය ඉදි කිරීම් කටයුතු
    - වේරහැර උප කාර්යාලයේ ඉදි කිරීම් කටයුතු
- මානව සම්පත් කළමනාකරණය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා රියදුරු බලපත්‍ර මුද්‍රණය දැක්විය හැක.

## 5.3.1වේරහැර උප කාර්යාලයේ ඉදි කිරීම් කටයුතු


**01.** රියදුරු පුහුණු ධාවන පථයේ ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇති අතර එහි පිටත ආරක්ෂක කැමරා පද්ධති (CCTV Camera) සහ ප්‍රධාන පාලක මැදිරිය සකස් කර ඇත.



**ප්‍රායෝගික පරීක්ෂණ පවත්වන නවතම වේරහැර රියදුරු පුහුණු ධාවන පථය**

### 02. වේරහැර ලේඛනාගාරය තුල නවීන පහසුකම් සහිත රාක්ක සවි කිරීම

ඉදිකරන ලද ලේඛනාගාරය තුළ නවීන පහසුකම් සහිත රාක්ක සවි කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර බහාලුම් වල තැන්පත් කර ඇති ලිපිගොනු පහසුවෙන් සොයා ගැනීමට හැකිවන අයුරින් අංක යොදා සකස් කර ඇති රාක්ක මතට ලිපිගොනු ඇසිරීම මේ වන විටත් සිදු කෙරෙමින් පවතී.







**නවීන පහසුකම් සහිත රාක්ක සවි කිරීම ,අංක නිකුත් කිරීම සහ රාක්ක වල ලිපි ගොනු ඇසිරිම**

## 5.4 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දැනට ක්‍රියාත්මක කාර්යයන්හි වර්තමාන ප්‍රගතිය

- **මෝටර් වාහන පනත සංශෝධනය කිරීම.**

මෝටර් වාහන පනතේ කඩිනමින් සංශෝධනය කළ යුතු බවට හඳුනාගන්නා ලද සංශෝධන ඇතුළත් පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර 2017.10.03 දින අනුමත කර ඇත. එය 2017 අංක 18 දරණ මෝටර් වාහන ( සංශෝධන) පනත වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

මෝටර් වාහන පනත යටතේ රථ වාහන වැරදි සඳහා දඩ මුදල් සංශෝධනය යටතේ මෝටර් වාහන පනතට සිදු කළ යුතු සංශෝධන පිළිබඳව පනතේ 4 වන ජේදය යටතේ ප්‍රගතිය වාර්තා කර ඇත.

- **නව මාර්ග සංඥා හඳුන්වා දීම.**

2015.11.12 දින හා අංක 1940/21 දරන 2015 අංක 02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇති මෝටර් වාහන ( සලකුණු සංඥා , සංකේත හා මාර්ග ලකුණු කිරීම්) නියෝග මඟින් නව මාර්ග සංඥා ප්‍රකාශයට පත් කර ඇත. ඉන් අනතුරුව ඒ සම්බන්ධ සංශෝධන ඉදිරිපත් වී නොමැත.

**මෝටර් වාහන පනත යටතේ රථ වාහන වැරදි සඳහා අදාළ දඩ මුදල් සංශෝධනය**

මෝටර් වාහන පනත යටතේ දඩ මුදල් සංශෝධනය සම්බන්ධව පරීක්ෂා කර නිර්දේශ ඉදිරිපත් කිරීමට අතිගරු ජනාධිපතිතුමා පත් කළ කමිටුවේ නිර්දේශ වලට අනුකූලව හා ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඒ සම්බන්ධව ලබා ගෙන ඇති අමාත්‍ය මණ්ඩල අනුමැතියන්ට අනුකූලව කටයුතු කරමින්,

I. 2017 අංක 18 දරණ මෝටර් වාහන (සංශෝධන) පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව II වන උපලේඛනගත වැරදි සඳහා ස්ථානීය දඩ මුදල් 2018.01.15 දිනැති හා අංක 2054/9 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති 2018 අංක 01 දරණ ස්ථානීය දඩ නියෝග මගින් ප්‍රකාශයට පත් කර ඇති අතර, එම නියෝග උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සභා සම්මත කර ඇත.

II. ඉහත කී කමිටු නිර්දේශ හා අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව මෝටර් වාහන පනත යටතේ වන බරපතල වැරදි සඳහා වන දඩ මුදල් සංශෝධනය සඳහා වන පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව හරහා සකස් කර ගරු නීතිපතිතුමාගේ අනුකූලතා සහතිකය ලබාදීමේදී වාර්තා කර ඇති සංශෝධන පිළිබඳව පැහැදිලි කිරීමක් ගරු නීතිපතිතුමාට යොමු කර ඇත. ඒ අනුව අදාළ අනුකූලතා සහතිකය ගරු නීතිපතිතුමාගෙන් ලබාගැනීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලයේ

අනුමැතිය සඳහා යොමු කළයුතු අතර, එම අනුමැතිය ලබාගෙන උත්තරීතර පාර්ලිමේන්තුවට යොමු කළ යුතුව ඇත.

## 6. ආදායම හා වියදම

### 6.1 ආදායම් ගිණුම

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් රැස් කරනු ලබන සියළුම ආදායම් කාණ්ඩ හතරක් යටතේ දැක්විය හැක. එනම්,

- සුබෝප‍භෝගී මෝටර් වාහන බද්ද
- මෝටර් වාහන විකිණීම මත බදු
- මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු
- තීරු බදු සහන බලපත්‍ර යටතේ අය කරනු ලබන බද්ද

**2018 වසර සඳහා ඇස්තමේන්තු කළ ආදායම හා තත්‍ය ආදායම**

**6.1.1 වගුව**

| ආදායම් විස්තරය/ආදායම් ශීර්ෂය | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන | 2018 වර්ෂයේ තත්‍ය ආදායම රු.මිලියන |
|---|---|---|
| මෝටර් රථප්‍රවාහන පනත යටතේ බදු අය කරනු ලබන ගාස්තු | 9,800.00 | 10,432.56 |
| මෝටර් වාහන විකිණීම මත බදු | 80.00 | 93.21 |
| සුබෝප‍භෝගි මෝටර් වාහන බද්ද | 1,600.00 | 1,036.07 |
| ආනයන බලපත්‍ර යටතේ අය කරන ගාස්තු | 100.00 | 39.92 |
| එකතුව | 11,580.00 | 11,601.76 |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

2018 වසරේදී ඇස්තමේන්තුගත මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අය කරනු ලබන බදු තත්‍ය ආදායම හි සැසඳීමේදී 6.45%කින්ද මෝටර් වාහන විකිණීම මත බදු 16.51%කින් ඉහළ ගොස් ඇත.නමුදු සුබෝප‍භෝගී මෝටර් වාහන බද්ද -35.25%කින්ද ආනයන බලපත්‍ර යටතේ අය කරනු බදු -60.08%කින්ද පහළ ගොස් ඇත. 2018දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත ආදායමට වඩා තත්‍ය ආදායම 0.19%කින් වැඩි වී ඇත.

## 6.2 වියදම් ගිණුම

දෙපාර්තමේන්තුව විසින් දරනු ලබන වියදම් ප්‍රධාන වශයෙන් කාණ්ඩ දෙකක් යටතේ වර්ග කළ හැක. එනම්,

1. පුනරාවර්තන වියදම
2. ප්‍රාග්ධන වියදම

### 6.2.1 වගුව

| වියදම් විස්තරය/වියදම් ශීර්ෂය | 2018 ඇස්තමේන්තුගත වියදම රු.මිලියන | 2018.12.31 දිනට තත්‍ය වියදම |
|---|---|---|
| පුනරාවර්තන වියදම | **2,142.68** | **2,100.21** |
| ප්‍රාග්ධන වියදම | **1,189.00** | **1,182.61** |
| මුළු වියදම | **3,331.68** | **3,282.82** |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

2018 වසරේ දෙපාර්තමේන්තුවේ මුළු ඇස්තමේන්තුගත වියදම රු.මි. 3,331.68 වන අතර වසරේ තත්‍ය වියදම රු.මි. 3,282.82 කි.එම වියදම පුනරාවර්තන වියදම හා ප්‍රාග්ධන වියදම ලෙස ප්‍රධාන වියදම් ශීර්ෂ දෙකක් යටතේ කාණ්ඩ ගත කළ හැක. වසරේ තත්‍ය පුනරාවර්තන වියදම රු.මි. 2,100.21ක් වන අතර තත්‍ය ප්‍රාග්ධන වියදම රු.මි. 1,182.61 කි.

### 6.2.2. වගුව - ප්‍රාග්ධන වියදම් වාර්තාව - 2018 (ජනවාරි - දෙසැම්බර්)

| වැය ශීර්ෂය | විස්තරය | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු. මි.) | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරිම | | | | |
| **307-02-01-2001** | ගොඩනැගිලි ඉදිකිරිම් | **5.00** | **5.00** | **100%** |
| **307-02-01-2002** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | **4.00** | **3.78** | **95%** |
| **307-02-01-2003** | වාහන | **2.00** | **0.66** | **33%** |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | | | |
| **307-02-01-2102** | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | **4.00** | **2.28** | **57%** |
| **307-02-01-2103** | යන්ත්‍ර හා යනේත්‍රෝපකරණ | **33.00** | **30.62** | **93%** |
| ගොඩනැගිලි සහ ඉදිකිරිම් | | | | |
| **307-02-09-2104** | වේරහැර යෝජිත ඉදි කිරීම් | **32.00** | **31.73** | **99%** |
| **307-02-01-2106** | පරිගණක මෘදුකාංග ප්‍රවර්ධනය | **7.00** | **6.85** | **98%** |
| හැකියා වර්ධන | | | | |
| **307-02-01-2401** | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධ | **2.00** | **1.68** | **84%** |
| වෙනත් මූලධන වියදම් | | | | |
| **307-02-01-01-2509** | රියදුරු බලපත් මුද්‍රණය | **1,100.00** | **1,099.96** | **100%** |

**මූලාශ්‍රය : මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**